# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23

# දිරන ණය සහන සභා පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 මැයි මස 23 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදි)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනත

[සහතිකය සටහන් කළේ 1975 මැයි මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 49/73.

තම සාමාජිකයන්ට ණය දීමේ, සකසුරුවම් ලෙස හා ඔවුන්ගේ ආදායම නොඉක්මවන ලෙස ජීවත් වීමට ශික්ෂණයක් ලබා දීමේ හා සහාය වීමේ සහ එම සාමාජිකයන් අතර අරපිරිමැස්ම සහ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රගුණ කිරීමේ කාර්යය සඳහා සියලු ම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ණය සහන සභා පිහිටුවීම පිණිස ද ඉහත කී කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

ණය සහන සභා දෙපාර්තමේන්තුව හා ණය සහන සභා අධ්‍යක්ෂවරයා.

2. (1) ණය සහන සභා දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ණය සහන සභා අධ්‍යක්ෂවරයකු සහ මේ පනතේ කාර්යයන් සඳහා අවශ්‍ය වන ණය සහන සභා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවක් ද වෙනත් නිලධරයන් සහ සේවකයන් ද පත් කරනු ලැබිය හැකි ය.

ණය සහන සභා සහ ඒවායේ සාමාජිකයෝ.

3. (1) එක් එක් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව සඳහා යටත් පිරිසෙයින් එක් ණය සහන සභාවක් පිහිටුවිය යුතු ය :

එසේ වුව ද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු එකකට වැඩි ගණනක් සඳහා එක් ණය සහන සභාවක් පිහිටුවීම අවශ්‍ය යයි හෝ උචිත යයි ණය සහන සභා අධ්‍යක්ෂවරයා කල්පනා කරන අවස්ථාවක, ඔහු විසින් ඒ සඳහා බලය දිය හැකි ය.

(2) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අනියම් සේවකයකු නොවන, සෑම සේවකයකු ම ඒ දෙපාර්තමේන්තුව සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභාවේ සාමාජිකයකු විය යුතු ය :

එසේ වුව ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ කාර්යයන් සඳහා අනුමත කරනු ලැබුවා වූ ද අසනීපයක් හෝ ආපදාවක් ඇති වූ අවස්ථා වන්හි දී තම සාමාජිකයන්ට ණය පහසුකම් හෝ සහන සැලසීමේ හෝ වෙනත් අන්දමේ මුදල් ආධාර දීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබුවා වූ ද යම් සභාවක සාමාජිකයකු වන්නා වූ සේවකයෙක් එවැනි යම් ණය සහන සභාවක සාමාජිකයකු වීමට බැඳී නොමැත්තේ ය.

ඊ 13221—13,818 (75/06)

කළමනාකාර කාරක සභාව.

4. (1) ණය සහන සභාවක කටයුතු කළමනාකාර කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. ඒ කාරක සභාව සභාපතිවරයකු ගෙන් ද ප්‍රථම සාමාජිකයන් පනස් දෙනා සඳහා නියෝජිතයන් පස් දෙනකු වශයෙනුත් ඊළඟ අමතර සාමාජිකයන් පනස් දෙනා හෝ ඉන් කොටසක් සඳහා එක් නියෝජිතයකු වශයෙනුත් වූ පදනමක් මත තෝරා ගනු ලබන නියෝජිතයන් විසි එක් දෙනකුට නොවැඩි නියෝජිතයන් සංඛ්‍යාවකින් ද සමන්විත විය යුතු ය:

එසේ වුව ද, ණය සහන සභාවක සාමාජිකයන්ගෙන් යම් විශේෂ කොට්ඨාශයක් හෝ පන්තියක් කළමනාකාර කාරක සභාවෙහි නියෝජනය වී නොමැති බවට ණය සහන සභා අධ්‍යක්ෂවරයා හැඟීමට පත් වුව හොත් කළමනාකාර කාරක සභාවට පත් කරනු ලැබීම සඳහා ඔහු විසින් නියෝජිතයන් තුන් දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් නම් කරනු ලැබිය හැකි ය.

(2) දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් නම් කරනු ලබන දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඒ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පිහිටුවනු ලැබූ ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ සභාපතිවරයා විය යුතු ය.

අනුකාරක සභා පත් කිරීම.

5. ණය සහන සභාවක කළමනාකාර කාරක සභාව විසින් ණය සහන සභාවේ නිශ්චිත කටයුතු කර ගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි අනුකාරක සභා පත් කරනු ලැබිය හැකි ය.

ණය සහන සභාවල කටයුතු.

6. (අ) සාමාජිකයන්ට ණය දීම;

(ආ) දෙනු ලබන ණය, සාමාජිකයන්ගේ නියම නිර්ව්‍යාජ අවශ්‍යතාවන්ට පමණක් සීමා වන බවට වගබලා ගැනීම;

(ඇ) දෙනු ලබන ණය ආපසු අය කර ගන්නා බවට වගබලා ගැනීම;

(ඈ) සකසුරුවම් ලෙස සහ තම ආදායම් නොඉක්මවන ලෙස ජීවත්වීමට සාමාජිකයන්ට ශික්ෂණයක් ලබා දීම සහ ඊට සහාය වීම;

(ඉ) සාමාජිකයන් අතර අරපිරිමැස්ම සහ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රගුණ කිරීම;

(ඊ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි ණය සහන සභාවලට සහ ඒ සභාවල කටයුතුවලට සම්බන්ධ වූ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය වීම; සහ

(උ) ණයගැති වී සිටින සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීමෙහි ලා සහාය වීම

ණය සහන සභාවල කටයුතු වන්නේ ය.

*ප්‍රධාන අරමුදල*

7. (1) ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන ප්‍රධාන අරමුදලක් තිබිය යුතු ය. ණය සහන සභාවල සාමාජිකයන්ගේ මාසික දායක මුදල් සහ ණය සහන සභාවල කටයුතු කරගෙන යෑම සඳහා ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන සියලු මුදල් ඒ ප්‍රධාන අරමුදලට බැර කළ යුතු ය.

(2) ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින්, අවශ්‍ය වන විට හා අවශ්‍ය වන පරිදි, ප්‍රධාන අරමුදලින් ප්‍රාදේශිය අරමුදලට මුදල් වෙන් කරනු ලැබිය හැකි ය.

*ප්‍රාදේශිය අරමුදල්.*

8. (1) සෑම ණය සහන සභාවක් විසින් ප්‍රාදේශිය අරමුදලක් පවත්වා ගෙන යා යුතු ය. සාමාජිකයන්ට ණය දීමේ සහ වෙනත් අනුමත වියදම් දැරීමේ සහ ආයෝජන කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන අරමුදලින් ප්‍රාදේශිය අරමුදලට කලින් කල වෙන් කරනු ලබන සියලු ම මුදල් ද දෙනු ලබන ණය වෙනුවෙන් සාමාජික යන්ගෙන් ආපසු අය කර ගනු ලබන මුදල් ද එකී ප්‍රාදේශිය අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රාදේශිය අරමුදලක බැරට තිබෙන්නා වූ ද ඒ අරමුදලේ කාර්යයන් සඳහා අවශ්‍ය නොවන්නා වූ ද යම් මුදලක් ප්‍රධාන අරමුදලට මාරු කරන ලෙස ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි ය.

*ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන මුදල් ආපසු ගෙවීම.*

9. ණය සහන සභාවල කටයුතු කරගෙන යෑම සඳහා ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන සියලු මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

*සාමාජික දායක මුදල්.*

10. (1) ණය සහන සභාවල සෑම සාමාජිකයකු විසින්, රුපියල් දෙකක අවම මාසික දායක මුදලකට වඩා අඩු නොවන පරිදි, තම මාසික ඒකාබද්ධ වැටුපෙන්, නියම කරනු ලැබිය හැකි සියයට එකක් නොඉක්මවන යම් මාසික දායක මුදල් ප්‍රමාණයක් සභාවට ගෙවිය යුතු ය.

(2) ඒ සාමාජිකයාගේ සේවා නියුක්තිය අවසාන වූ විට, ඒ දායක මුදල් වෙනුවෙන් වූ යම් ලාභාංශයක් තිබුණහොත් ඒ ලාභාංශය ද සමඟ ඒ දායක මුදල් ඒ සාමාජිකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

*රක්ෂණ අරමුදල.*

11. ආපසු අය කර ගත නොහැකි ණය හේතුකොට ගෙන ඇති වන පාඩු පියවීම පිණිස ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ අරමුදලක් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යා යුතු ය.

*අරමුදල්වල ගණන් හිලව් පවත්වා ගෙන යාම.*

12. (1) ප්‍රධාන අරමුදලේ ගණන් හිලව් ක්‍රමිකව පවත්වා ගෙන යාමටත්, එක් එක් අවුරුද්දක් සඳහා වූ ගණන් හිලව් විගණකාධිපතිවරයා ලවා විගණනය කරවා ගනු ලැබීමටත් ණය සහන සභා දෙපාර්තමේන්තුව විසින් සැලැස්විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් හැකි ඉක්මණින් විගණකාධිපතිවරයාගේ වාර්තාව ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම ණය සහන සභාවක් විසින් ප්‍රාදේශීය අරමුදලේ ගණන් හිලව් ක්‍රමිකව පවත්වා ගෙන යාමටත් විගණකාධිපතිවරයා ලවා අවුරුදු පතා විගණනය කරවා ගනු ලැබීමටත් සැලැස්විය යුතු ය.

නියෝග.

13. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධි විධාන බල ගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරනු ලබන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත යම් කරුණක් ;

(ආ) ණය සහන සභා තෝරා පත් කිරීම හා සම්බන්ධ සියලු කරුණු ;

(ඇ) ණය සහන සභාවල සාමාජිකයන්ට ණය දීම සහ ඒ ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් වූ සියලු කරුණු ;

(ඈ) ප්‍රධාන අරමුදල සහ ප්‍රාදේශීය අරමුදල් පරිපාලනය කිරීම ;

(ඉ) ඒකාබද්ධ අරමුදලින් දෙනු ලැබූ මුදල් ආපසු ගෙවීම ;

(ඊ) සාමාජික දායක මුදල් අය කර ගැනීම සහ ඒ මුදල් ආපසු ගෙවීම ;

(උ) සාමාජික දායක මුදල් මත ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම ;

(ඌ) රක්ෂණ අරමුදල පරිපාලනය කිරීම ;

(එ) ප්‍රධාන අරමුදලේ සහ ප්‍රාදේශීය අරමුදල්වල ගණන් හිලව් පවත්වා ගෙන යාම ; සහ

(ඒ) මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට ආනුෂංගික වූ හෝ සම්බන්ධ වූ සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයේ දක්වෙන වෙනත් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

14. මේ පනතෙහි "අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.